**මහව ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 24 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 01 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 11 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ණයහිමි ශේෂය රු.1,065,225 ක් වූ නමුත් ණය හිමිලේඛනයේ / උපලේඛනයේ ශේෂය රු.660,654 ක් වූයෙන් රු.404,571 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්තම් සසදා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන වල සහ ණයහිමි උපලේඛන තොරතුරු වල වෙනසක් ඇති බව පිළිගන්නා අතර, එම තත්ත්වය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | එකතුව රු. 43,500,123 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළව ලේඛන/ උපලේඛන/ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විගණනය වෙතින් ලිඛිත සාක්ෂි නොමැති බවට ඉදිරිපත් කර ඇති තොරතුරු විශ්ලේෂණය කර, ඉදිරියේදී මේ සම්බන්ධව තහවුරු කර ගැනීමෙන් පසුව විගණනයට වාර්තා කරමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම්**

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>(i) රීති 33 | ගෙවීම පැහැර හරින පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහිදී පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙසට කටයුතු කරමි. |
| (ii) රීති 218 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කරමි. |
| (ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,682,032 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,884,906 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 5,804,712 | 5,641,448 | 4,601,969 | 4,065,414 | 4,880,275 | 5,773,310 | 4,917,781 | 3,036,671 |
| II. | බදු කුලී | 12,375,000 | 12,642,792 | 12,549,490 | 186,182 | 12,875,000 | 10,620,991 | 10,979,715 | 133,231 |
| III. | බලපත්‍ර ගාස්තු | 956,000 | 880,710 | 880,434 | - | 846,000 | - | 917,759 | - |
| IV. | වෙනත් ආදායම් | 106,272,000 | 76,439,538 | 62,259,370 | 78,642,869 | 18,341,000 | - | 18,764,386 | 43,306,407 |
| | එකතුව | 125,407,712 | 95,604,488 | 80,291,263 | 82,894,465 | 36,942,275 | 16,394,301 | 35,579,641 | 46,476,309 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු2,827,256 ක් වූ වරිපනම් බදු හිඟය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 3,651,635 ක් දක්වා වර්ධනය වී තිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**2.2.3 කුලී**

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු. 2,775 ක් වූ හිඟ බදු කුලිය 2008 වර්ෂයට පෙර සිට පැවති ශේෂයක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ශේෂය රු.183,407 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යය සාධනය**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් අමාත්‍යවරයා විසින් සාදන ලද සම්මත අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන තිබුණ ද සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ අවශ්‍යතාවය මත අතුරු ව්‍යවස්ථා පැනවීමටත්, සභාව විසින් වැළඳගත් සම්මත අතුරු ව්‍යවස්ථා අනුව කාර්යයන් සිදු කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි අතුරු ව්‍යවස්ථා පනවාගැනීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 04 ක් වෙනුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමට ගෙවිය යුතු ශේෂය රු. 4,012,763 ක් විය. | හඳුනාගෙන ගෙවීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් ගෙවීමට ඇත්තේ කුමන සේවකයින් සඳහාද යන්න තහවුරුවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇතත්, එය නොලැබූ නිසා ගෙවීම් ප්‍රමාද වී ඇත. එවැනි. විශාල මුදලක් එකවර ගෙවීමට හැකියාවක් නොමැති බැවින්, මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 91,120,052 ක් වූ ලැබිය යුතු ශේෂයෙන් රු.37,928,067 කට කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. ලැබිය යුතු ගිණුම් තුළ දීර්ඝ කාලයක සිට පවතින තොරතුරු ඉදිරිපත් නොකල රු. 6,098,770 ක අත්තිකාරම් ශේෂයක්, රු. 559,990 ක පොදු අත්තිකාරම් ශේෂයක් හා මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබිය යුතු රු. 761,854 ක් ද වසරකට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.46,283,404 ක් ද විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු ගිණුම් වලට අදාල විශ්ලේෂණය සකස් කරන අතර ව්‍යාපෘති සඳහා අත්තිකාරම් වශයෙන් මුදල් ලබා ගෙන ඒවා ඉටුකර ඇතත්, ඒවා නොපියවීම නිසා මෙවන් ශේෂයක් පෙන්නුම් කර ඇත. මේ වන විට එම තත්ත්වය නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට රු. 61,745,451 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වලින් රු.18,951,330 කට කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ අතර වර්ෂ 03 ක් ඉක්මවා තිබුණු රු.28,109,578 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගෙවිය යුතු ගිණුම්වලට අදාල තොරතුරු සහ ලේඛන පරික්ෂා කර බලා, කර්මාන්ත ණයහිමියන් සහ ආපසු ගෙවිය යුතු තැන්පත් නිරවුල් කිරීමටත්, තවදුරටත් නිරවුල් කිරීමට නොහැකි ශේෂයක් ඇත්නම්, ඒවා ගැලපුම් කර නිවැරදි කිරීමටත් කටයුතු කරමි. |
| (ඈ) | මහව පොදු වෙළඳ සංකීර්ණයට විදුලිය ලබා නොගැනීම හා දොරවල පවතින අඩුපාඩු හේතුවෙන් වසර 2 කට අධික කාලයක් කඩ කාමර කුලියට ලබා දීමට නොහැකි වීමෙන් අවම වශයෙන් රු.3,276,000 ක ආදායම් සභාවට අහිමි වී තිබුණි. | සභාව සතු දේපලවලින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | විදුලි බල මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව මේ වන විට විදුලි සැපයුම ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුවන අතර කඩිනමින් විදුලිය ලබාදී කඩ කාමර ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කිරීමට හැකිවන බව සඳහන් කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැඩ තහනම් කිරීම, ස්ථාන මාරු හා සේවය අතහැර යාම හේතුකොට ගෙන දීර්ඝ කාලයක සිට අය නොවන සේවක ණය ශේෂය රු. 208,863 ක් විය. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අය නොවන සේවක ණය අයකර ගැනීම සඳහා දැනට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2009 හා ඊට පසු වර්ෂවල ඉදිකර ඇති දුරකථන/ විදුලි සංදේශ කුළුණු 07 කින් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව ගාස්තු අය නොකිරීම නිසා දළ වශයෙන් රු. 152,000 කට වැඩි ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | අංක1597/8 හා 2009.04.17 දින නිකුත් කර ඇති අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කර ඇත්තේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 08 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධනය හා පූජා භූමි සංවර්ධනය සඳහා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග වන අතර එම ගැසට් නිවේදනය අනුව පළාත් පාලන |

| | | | |
|---|---|---|---|
| | | | ආයතන වලට ගාස්තු අයකිරීමේ නීතිමය හැකියාවක් නොමැත. |
| (ආ) | අඹන්පොළ මුස්ලිම් පල්ලිය අසල ස්ථාපිත කර ඇති සෙල්ටෙල් ලංකා පුද්ගලික සමාගමට අයත් කුළුණු ඉදිකිරීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී නොතිබුණු අතර ඊට පෙර සභාව විසින් සැලසුම් අනුමත කර තිබුණි. පසුව ඉදිකිරීම් නතර කරන ලෙස දැනුම් දී තිබුණද කුළුණු ස්ථාපිත කර ඇති අතර ඒ පිළිබඳ නීත්‍යානුකූල පියවර ගෙන නොතිබුණි. | සභාවේ අනුමැතියකින් තොරව සිදුකරනු ලබන ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2006.11.02 ලිපිය මඟින් හා 2006.11.21 දින සෙල්ටෙල් සමාගම වෙත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලිපිය පරිදි අදාල ඉදිකිරීම් නතර කරන ලෙස ලේකම්වරයා විසින් දැනුවත් කර ඇති අතර, 2007.01.11 දින ගරු සභාපතිවරයා විසින් ඉදිරිකිරීම් නතර කරන ලෙසත්, එසේ නොකරන්නේ නම්, නීති ක්‍රියාමාර්ග ගන්නා බවත් සඳහන් කර තිබුණද ලිපි ගොනු පරීක්ෂා කිරීමේදී එසේ නීති ක්‍රියාමර්ග ලබාගත් බවක් දක්නට නොමැති බව දන්වමි. |
| (ඇ) | නිශ්චිත රේටයන් දක්වා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමෙන් තොරව කුළුණු 07 කින් එක් එක් සමාගම් වලින් විවිධ ගාස්තු ප්‍රමාණයන් මත එකතුව රු. 932,400 ක් අයකර තිබුණි. | ඉහත (අ) හි සඳහන් ගැසට් නිවේදනය පරිදි හෝ සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නිශ්චිත පදනමක් මත ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | භාරතී එයාටෙල් සමාගමට අයත් දළදාගම, මහව කුළුණ සඳහා රු.200000/- ක මුදලක් ද හච්සන් ටෙලිකොම් ලංකා පුද්ගලික සමාගමට අයත් කුළුන හා ලංකා බෙල් පුද්ගලික සමාගමට අයත් කුළුණ සඳහා රු.115000/- ක මුදල් අයකරගෙන ඇති අතර, එම මුදල් අයකර ගත් ආකාරය පිළිබඳ සටහනක් සොයාගත නොහැක.<br>අනුරාධපුර පාර අඹන්පොල සෙල්ටෙල් ලංකා පුද්ගලික සමාගමට අයත් කුළුණ හා සිංහාරගම, මහව ඩයලොග් සමාගමට අයත් කුළුණ සඳහා ලිපිගොණු අනුව පෙරසැරි ගාස්තු රු.8000/- ක් අයකරගෙන ඇත. |

## 04. ගිණුම් කටයුතු හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එය 2019 මැයි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | අදාළ රීති උපදෙස් පරිදි නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණ ද ඔහුට වෙනත් රාජකාරීන්ද පවරා තිබුණෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මු.රෙ. 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණනය සිදුකළ යුතුවේ. | හැකිතරම් දුරට අභ්‍යන්තර විගණන නිලධාරියා ස්වාධීනව කටයුතු කිරීමට යොදවන බව දන්වමි. |